# ඥානය ගැලවීයාම නොහොත් නිවන් අවබෝධය



ඥානය යනු මියගිය අතීතයේදී අප ඇසූ දුටු, කියවා බැලූ හා අත්දුටු දේ අනුව අපගේ මොළයෙහි භෞතික ස්නායු ශෛලතුළ විද්‍යුත්-චුම්භක ශක්තියෙන් තැන්පත්ව ඇති මතක සටහන් සම්භාරයයි.

ඒ සටහන්වලට පදනම්වූ හැම අත්දැකීමක්ම සාපේක්ෂක වශයෙන් ඉතා සීමිත නිසා ඒ හැම මතක සටහනකම තැන්පත්ව ඇති ඥානය නම් දනුමද ඉතා සීමිතය. එම නිසා යමෙක් හෝ යමක් ගැන අප දන්නා දේද ඉතා සීමිතවන අතර, ඒ ගැන අප නොදන්නා දේ අසීමිතය. අප්‍රමාණය. ඒ අනුව අපේ සීමිත ඥානයතුළ ඇත්තේ ඥානවන්තකමට වඩා අඥානවන්තකම නමැති මෝහයයි. අපගේ මානව පරම්පරාව මෙතෙක් රැස්කරගෙන ඇති විද්‍යා, තාක්ෂණ, කලා හා දාර්ශනික ඥානය මානව සංහතිය අද බුක්තිවිඳින සිලුම සම්පත්වල නිර්මාතෘවී ඇතත් ඒ සියලු සම්පත් ඉක්මවා ගිය නිර්වාණ සම්පත්තිය සාක්ෂාත් කරගැනීමට ඇති ප්‍රධාන බාධකයත් ඒ ඥානය නමැති අඥානවන්තකම නොහොත් මෝහයයි. එම නිසා නූතන විද්‍යාඥයන්, ප්‍රාඥයන් හා ත්‍රිපිටකවාගීශ්වර පණ්ඩිතයන් නිවන ගැන කොතෙක් දෑ කීවත් ඒ අය නිවන ගැන සාක්ෂාත් ලෙස දන්නා කෙම්ගෙඩියක් නැතැයි කීම නිවැරදිය.

සැබෑ නිවන යනු අප මෙතෙක් ගබඩා කරගෙන ඇති ඥානසම්භාරය නමැති මෝහයෙන් ගැලවීයාමයි. පරම විමුක්තිය යනු ඒ ඥාන සම්භාරයේ බරින් නොහොත් ග්‍රහණයෙන් මිදීමයි.

දිට්ඨිංච අනුපගම්ම සීලවාදස්සනේන සම්පන්නෝ යයි කරණීයමෙත්ත සූත්‍රයෙහි සඳහන් වෙන්නේ පරණ මතක සටහන් නැමැති ඥානය පදනම් කරගත් මෝහමූලික මතවාද නමැති පූර්ව නිගමනයන්ට යට නොවී ඇත්ත ඇති සැටියෙන් දැකීමයි. බුදුහිමියනට බුදුවෙන අස්ථාවේදී සියලුම පූර්වනිගමනයන් නමැති දෘෂ්ටිවලින් මිදී අත්දකින්නට ලැබුනේ එතෙක් නොඇසූවිරූ අපූර්ව දහමක් බවයි පුබ්බේසු අනනුස- 'සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි යන ධම්මචක්කප්පවත්තන සූත්‍ර පාඨයෙන් කියවෙන්නේ. ඉන් අදහස්වෙන්නේ එතෙක් දත් සියලු දේ පසුකර අලුත් දහමකට සිත පිවිසි බවයි.

එසේ නිවන් දැකිය හැක්කේ දන්නා සියල්ල නමැති ඥානය ඉක්මවා ගිය පසුවයි. මෝහාන්ධකාරයෙන් නිවන වසාගන්නා සක්කායදිට්ඨිය නමැති මමත්වය ගොඩනැගෙන්නේ ඒ ඥානයෙනි. මගේ උගත්කම, මගේ මතය, මගේ පාරම්පරික උරුමය, මගේ සංස්කෘතිය, මගේ ආගම, මගේ රට, මගේ වස්තුව, මගේ අඹුදරු, නෑදෑ, හිතමිතුරන් ආදී වශයෙන් අප හිතන දේ පිළිබඳ ඥානය අපේ මමත්වය ගොඩනගන සාධකයෝ වෙති. එහෙත් නිවන මගේ සීමිත ඥානය මෙන් මගේයයි වෙනම කොටුකරගෙන වෙන්කරගත හැකි නොවේ. මමය මාගේය යන මමත්වය නොහොත් සක්කායදිට්ඨිය යන මතයේ පදනම අප දන්නා දේ නමැති ඥානයයි.

එම නිසා සක්කායදිට්ඨිය බිඳවැටීම යනු ඒ ඥානයේ ග්‍රහණයෙන් අත්මිදීම වන්නේය. නිවන් දැකීමේ මුල් පියවර එසේ සක්කායදිට්ඨියෙන් අත්මිදීමය. බුද්ධඝෝෂ හිමියන් මග්ගමත්ථි ගමිකො නවිජ්ජති යයි වදාරන පරිදි නිවන් දකින මගක් තිබුණද එහි ගමන් කරන්නකු දක්නට නැත. එසේම විවිධ මතිමතාන්තර වලින් නිර්මාණය වුණු මමය යන මතය නොහොත් මමත්වය තිබෙනතුරු නිවන් දැකිය නොහැක.

අත්ථි නිබ්බුති නනිබ්බුතො යයි බුද්ධඝෝෂ හිමියන් වදාරන පරිදි නිවනක් ඇතද නිවන් දක්ක පුද්ගලයකු නිවනේ දක්නට නැත. නිවන් දැකීමේදී අප අත්හරින පුද්ගලභාවය නිර්මාණය කළ සීමිත ඥානය නොහොත් අප දන්නා අල්ප දනුම ඉතා සීමාසහිත වුව ද අප නොදන්නා නිවන අසීමිතය, අනන්තය, අකාලිකය.

♦ **සම්මානිත මහාචාර්ය**
**ටී. එස්. අබේවික්‍රම** Harrow UK




## නව මහ කොමසාරිස්තුමාගේ අක්තපත්‍ර භාරදීම

ශ්‍රී ලංකාව විසින් එක්සත් රාජධානියට පත්කරනු ලැබ සිටින නව මහකොමසාරිස්වරයා වන දොස්තර ක්‍රිස් නෝනිස් මහතා නොබෝදා ලන්ඩනයේ බකිංහැම් මාළිගයට ගොස් බ්‍රිතාන්‍ය මහරැජිණ හමුවී නිලවශයෙන් කෙරෙන අක්ත පත්‍රය හෙවත් තමා එම නිලය ලැබූ බවට ඇති සාක්ෂිපත්‍රය ඇයට භාරදුන්නේය. බ්‍රිතාන්‍ය රාජ්‍යයේ ප්‍රධානියා මහ රැජිණ බැවින් බ්‍රිතාන්‍යයට පත්වීම් ලබා පැමිණෙන සියළු තානාපතිවරුන් සහ මහකොමසාරිස්වරුන් ප්‍රථමයෙන් රැජිණ හමුවීමට ගොස් තමාගේ පැමිණීම දැන්වීම චාරිත්‍රයකි. ඒ ගමන යාමට පිළියෙළ කරන ලද විශේෂ අශ්ව රථයක් ද මාළිගයෙන් මහ කොමසාරිස්වරයාට එවනු ලබයි.

මහරැජිණ විසින් නව මහකොමසාරිස්වර දොස්තර නෝනිස් මහතා ඉතා උණුසුම් අන්දමින් පිළිගත් ලැබූ අතර නෝනිස් මහතා ප්‍රථමයෙන් තමා ශ්‍රීලංකා ජනාධිපතිවරයාගේ සුබ පැතුම් රැජිණට පිළිගන්වමින් 2013 දී ශ්‍රීලංකාවේ පවත්වන්නට බලාපොරොත්තු වන පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල සමුළුවේදී එතුමියගේ පැමිණීම ද ශ්‍රී ලංකාව උදක්ම බලාපොරොත්තුවන බවද පැවසුවේය. මහරැජිණ තමා ලංකාවට ගිය පූර්ව ගමන් ගැන සතුටින් මතක් කරමින් බොහෝ වේලාවක් සුහද සාකච්ඡාවක යෙදුනාය.

දොස්තර ක්‍රිස් නෝනිස් මහතා ශ්‍රීලංකාවෙන් මෙතෙක් බ්‍රිතාන්‍යයට පත්ව ආ ළාබාලම මහකොමසාරිස්වරයා ය.

Sri Lanka's new High Commissioner to Great Britain **Dr Chris Nonis** recently presented his credentials to the **Queen Elizabeth II**. at the **Buckingham Palace**.

This is the moment the Queen warmly welcomed the new HC from Sri Lanka.

Dr Nonis is said to be the youngest High Commissioner appointed by the Government of Sri Lanka to the United Kingdom.



*බ්‍රිතාන්‍ය මහ රැජිණ බකිංහැම් මාලිගයේදි අතට අත දී නව ශ්‍රීලංකා මහකොමසාරිස්වර ක්‍රිස් නෝනිස් මහතා පිළිගනී*

FAST CASH
SEND TODAY - COLLECT TODAY

මේ උත්සව සමයේ ඔබගේ නෑදෑ හිතමිතුරන්ට පහසුව, සුරක්ෂිතව මුදල් යැවීම සඳහා එකම විශ්වාසවන්ත නාමය

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

Transfer Fees From only £5




COMMERCIAL BANK | BOC BANK OF CEYLON | HNB | HSBC | සම්පත් බැංකුව SampathBank | PEOPLE'S BANK | Standard Chartered

020 8886 4488 www.efastcash.co.uk
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT